# නිති සම්පත්තිය ලැබේවා ඔබහට

දයාබර නදීපට, මිතුරු රවිඳු ගෙන්



මගෙ දුක කියන්න අවසර දෙනවද සිව් වසරක් නොදැනිම ගෙවිලා
මගෙ සිත, මගෙ නෙත ඔබ ගැන සිත සිත ඔබ එනතුරු ඈත හිඳීබලා
කීමට බොහෝ දේ ඉතිරිව තිබුණත් සිත තුළ සිතුවිලි නිහඬවෙලා
ඔබ මිහිදන් කළදා දෙනෙතින් වැටි කඳුලැලි තව ඈත ඉතිරිවෙලා

පින්බර සඳ පායා ඈති යාමේ විහඟුන් මොරදෙන දුක ඇසුණා
සුවඳැති කුසුමට පොරකන බිඟුගේ දුක් ගී මා දෙසවන වැකුණා
ඔබ ගැන මිතුරන්, නෑයන් පවසන රසැති කතා සවනට ඉසුණා
කතාකරන්නට ඔබ අප ළඟ නැත, අකලට ඔබගේ නෙත් වැසුණා

උපදින සැමහට මරණය උරුමයි - ලෝ දහමයි ඔබ පසක් කළේ
වාවන්නට බැරි දුකකි ජීවිතේ - ඔබ මැනවින් එය සපට කළේ
ඔබ මුව දැක ඉපිළී ගිය දෙනෙතට ඇයි කඳුළැලි ඔබ උරුම කළේ
"නිති සම්පත්තිය" ලැබේවා ඔබහට ඒ - යැදුමයි අප සැම කළේ

**රවිඳු පොන්සේකා**